# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/33 – 2012 අගෝස්තු 23 වැනි බ්‍රහස්පතින්දා – 2012.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ගම්/ප්‍රාලේ/2/2/1/120.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යක්කල ගමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්. 0.3700 ක් වූ ඉඩම් කොටස සඳහා සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ මිනුම් අධිකාරි විසින් මැන සකස්කළ මු.පි.ගම්. 3849 දරන මූලික පිඹුරේ විස්තර කෙරෙන පහත ඉඩම් කොටස:

**කැබලි අංක 01**

ඉඩමේ නම: දඹුවේවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 25-30 පමණ වයසැති මිශ්‍ර වගාවක්, ස්ථිර ගොඩනැගිලි දෙකක්, ළිඳක් සහ බුදු මැදුරක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. එම්. පීරිස්, දඹුවේ වලව්ව, යක්කල; ප්‍රමාණය: හෙක් 0.3700.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 02 වැනි දින පෙ.ව. 10.00 ට ගම්පහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

සී. පී. ඩබ්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2012 අගෝස්තු මස 22 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ගම්පහ.

09 – 210


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.